# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

බීපීයූ/ඊඊ-02/පීජී/01(එම්.ඒ-2025)

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.
දු.ක. : 011-2580609
2025.09.08

**සියලු ම විද්‍යාර්ථීන් වෙත,**

**ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය - විභාග සහ සම්මන්ත්‍රණ සඳහා ලියාපදිංචි කිරීම 2025 ඔක්තෝබර්/නොවැම්බර්/දෙසැම්බර් (2025 ලියාපදිංචි සිසුන්)**

මෙම විශ්වවිද්‍යාලයේ **2025** අධ්‍යයන වර්ෂයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වී සිටින ඔබ වහන්සේ/ඔබ සඳහා පැවැත්වෙන ශාස්ත්‍රපති පාඨමාලාවේ පරීක්ෂණය **2025 දෙසැම්බර් මාසයේ** පැවැත්වීමට නියමිත ය.

ඔබ වහන්සේ/ඔබ වෙත මේ සමඟ ඉදිරිපත් කරන අයදුම්පත සම්පූර්ණ කර ලියාපදිංචි තැපැල් මගින් හෝ පහත ලිපිනයට රැගෙනවිත් 2025.09.30 දිනට පෙර ලබාදිය යුතු අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **''ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය - 2025 දෙසැම්බර්''** යනුවෙන් සඳහන් කළ යුතුය.

සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

තවද, ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා පෙනී සිටීම සඳහා ඔබ වහන්සේ/ඔබ විසින් පහත අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම ද **අනිවාර්ය** බව කාරුණිකව දන්වා සිටිමි.

**විභාග ලියාපදිංචි වීම**

(1) සම්පූර්ණ පාඨමාලා ගාස්තුව ගෙවා තිබීම.

ශාස්ත්‍රපති **එක් අවුරුදු** පාඨමාලා ගාස්තුව (අයදුම්පත් ගාස්තුව සමඟ) - රු. 45000.00
ශාස්ත්‍රපති **දැවුරුදු** පාඨමාලා ගාස්තුව (අයදුම්පත් ගාස්තුව සමඟ) - රු. 74500.00

ඉතිරි මුදල් ගෙවීම ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ **ගිණුම් අංක 711202** ට බැර කළ හැකි අතර රිසිට්පත විභාග සඳහා ලියාපදිංචි වීමේ අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුයි.

සැ.යු. **ඔබ වහන්සේ/ඔබ ශිෂ්‍යත්වයක් සඳහා හිමිකම් ලද අයෙකු නම් ශිෂ්‍යත්වයක් මුදල ඔබ වහන්සේගේ/ඔබගේ පාඨමාලා ගාස්තුවෙන් අඩුකරනු ලැබේ. විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු මුදලක් තිබේනම් දැනගැනීම සඳහා ඇමුණුම බලන්න.**

(2) ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා ලියාපදිංචි වීමට පෙර පහත සඳහන් සහතිකවල සහතික කළ පිටපත් ඉදිරිපත් කර තිබිය යුතුය.

**ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කර තිබීම.**

**ඔබ විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකපත්වල සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කර තිබීම.**

**සහතික කරන ලද පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප දෙකක් (02) ඉදිරිපත් කර තිබීම.**

මින් පෙර ඉහත අංක **02** යටතේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර විශ්වවිද්‍යාලය වෙත ලබා දී ඇත්නම් එය නො සලකා හැරිමට කටයුතු කරන්න.

නියමිත දිනෙන් පසුව ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කරන්නන් සඳහා අදාළ පරීක්‍ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නො ලැබේ.

## සම්මන්ත්‍රණ මාලාව පැවැත්වීම

පාඨමාලාවේ අවසන් පරීක්ෂණයට සූදානම් කිරීමක් වශයෙන් සම්මන්ත්‍රණ මාලාවක් **2025 නොවැම්බර් මාසයේ** පැවැත්වීමට විශ්වවිද්‍යාලය තීරණය කර ඇත. මේ සඳහා අදාල සම්මන්ත්‍රණ ගාස්තු ගෙවා, මේ සමඟ ඉදිරිපත් කරන අයඳුම්පත්‍රයෙහි සඳහන් තොරතුරු සම්පූර්ණ කර මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට **ඉහත සඳහන් නියමිත දිනට පෙර** ලබාදිය යුතු බව කරුණාවෙන් දන්වමි.

ඔබ වහන්සේ/ඔබ සම්මන්ත්‍රණයට සහභාගි වීමට අපේක්ෂා කරන්නේ නම් පහත සඳහන් ගාස්තු ගෙවා ලියාපදිංචි විය යුතුය.

**සම්මන්ත්‍රණ ගාස්තු**

| | |
|---|---|
| එක් විෂය පත්‍රයක් සඳහා | - රු. 500.00 |
| විෂය පත්‍ර 06 සඳහා | - රු. 3000.00 |

මෙම ගාස්තු ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ **ගිණුම් අංක 711202** ට බැර කළ හැකි අතර රිසිට්පත සම්මන්ත්‍රණ සඳහා ලියාපදිංචි වීමේ අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුයි.

## ශාස්ත්‍රපති දැවුරුදු පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම

**ශාස්ත්‍රපති දැවුරුදු** පාඨමාලාව හදාරන විද්‍යාර්ථියෙක් නම් පර්යේෂණ මාතෘකාව සහ පර්යේෂණ සැලැස්ම මේ සමඟ යොමු කරන අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි.

ශාස්ත්‍රපති දැවුරුදු පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් සඳහා පර්යේෂණ මාතෘකාව අනුමත කිරීම, උපදේශකවරයෙකු නම් කිරීම පසුවට දැනුම් දෙනු ලැබේ.

වැඩි විස්තර සඳහා දුරකථන අංක **011-2580609 / 2502944** අමතන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ඒ.එම්.කේ.ජේ. අතපත්තු
සහකාර ලේඛකාධිකාරී
(පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය)
ලේඛකාධිකාරී වෙනුවට